(ඇ) එළුවන් ඇති කිරීමේ ව්‍යාපෘතිය - 2022

I. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික හෝග වගා හා ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම සඳහා ක්‍රියාත්මක උක්ත ව්‍යාපෘතිය යටතේ එළුවන් මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශවලට පටහැනිව අවුරුදු 2 ක් ඉක්මවූ එළුවන් 35 ක්, අවුරුදු 1.5 ට අඩු එළුවන් 71 ක් ද, නිර්දේශිත බර ප්‍රමාණයන්ට ඉක්මවූ එළුවන් 12 ක් හා අවම බර ප්‍රමාණයට වඩා අඩු

බරති එළුවන් 49 ක් ද මිලදී ගෙන තිබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙන් බලාපොරොත්තුවූ සත්ත්ව අභිප්‍රේරණය හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ අරමුණු සාක්ෂාත් කර ගත නොහැකි විය.

II. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂකගේ අංක GAT/PLA/GRP/DO.09/2022 දරන 2022 නොවැම්බර් 12 දිනැති ලිපියෙන් මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී ප්‍රතිලාභීන්ගෙන් මුදල් කිසිසේත් අවශ්‍ය නොවන බව සඳහන් කර තිබුණද, ගෝමරන්කඩවල, මොරවැව හා සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 104 දෙනෙකුට අදාළව රුපියල් 417,845 ක් ප්‍රතිලාභීන්ගෙන් අය කර ගෙන තිබුණි.

III. පසුගාමී ග්‍රාමීය සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක RDAH&EC/DP/10/004 දරන 2022 සැප්තැම්බර් 22 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රතිලාභීන් වෙත ලබා දෙන එළුවන් විධිමත්ව රක්ෂණය කර තිබිය යුතු බවට සඳහන් කර තිබුණද, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ප්‍රතිලාභීන් 16 දෙනෙකු සඳහා පිරිවැය රුපියල් 591,000 ක් වූ එළුවන් ලබාදී තිබුණද එම එළුවන් රුපියල් 399,000 ක් වූ අඩු මුදලකට රක්ෂණය කර තිබුණි. මේ හේතුවෙන් එළුවන් මියයාමකදී උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට තිබූ හැකියාව අහිමි කර ගෙන තිබුණි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

සම්මත පරිදි නීති, රීති හා රෙගුලාසිවලට යොමුව හා අනුකූල නොවීම් පහත පරිදි නිරීක්ෂණය විය.

රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) චක්‍රලේඛ අංක 09/2009 හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (iv) ඡේදය	අතිකාල හා නිවාඩු දින ගෙවීම් කිරීමේදී ඇඟිලි සපකුණු යන්ත්‍ර මඟින් තහවුරු කිරීම අත්‍යවශ්‍ය වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිළධාරීන් විසින් එලෙස කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුපදී එකතුව රුපියල් 1,370,455 ක් අතිකාල හා නිවාඩු දීමනා ලෙස ලබා ගෙන තිබුණි.
(ආ) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක NSE/EL/01/ 2018 හා 2018 ඔක්තෝබර් 15 දිනැති චක්‍රලේඛයේ 2.5 වගන්තිය	මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි දීමනා ලාභීන්ගේ නුසුදුසුභාවය හේතුවෙන් අවලංගු කරන ලද ගෙවීම් සහතික පත් ප්‍රාදේශීය ලේකම් භාරයට ගෙන නොතිබුණි.
(ඇ) මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය	නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රුපියල් 6,000,000 ක මුදල් තත්කාර්ය අතුරු අග්‍රීම වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2022 සැප්තැම්බර් 13 වන දින, වී මිලදී ගැනීම් සඳහා ගෙවා තිබීම.

2.6 අවධිමත් ගනුදෙනු

මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව සහතික නොකළ ගනුදෙනු

කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහරුල් ග්‍රාම නිලධාරී වසමේ ප්‍රාදේශීය සභාව ආසන්නයේ පිහිටි මාර්ගයේ රුපියල් 582,000 ක වටිනාකමැති කානු පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතියේ බොරළු වැඩ සඳහා වන CBR පරීක්ෂණ වාර්තාව අනුව බොරළු සාම්පල් ලබා ගෙන පරීක්ෂණ කටයුතු ආරම්භ කල දිනය (Date of Cast) 2022 අප්‍රේල් 21 සහ බොරළු ආදර්ශ පරීක්ෂා කල දිනය (Date of Test) 2022 අප්‍රේල් 25 වශයෙන් දක්නට ලැබුණු අතර මෙම බොරළු වැඩ සඳහා ගෙවීම් කිරීමට ඉදිරිපත් කර ඇති අවසන් බිල්පතේ විෂය කරුණු අංක 7 සහ 8 සඳහා ගෙවීම් කිරීමට රුපියල් 313,586 ක් 2022 මාර්තු 30 වන දින ලබා දී තිබුණි.

2.7 තැන්පතු

අදාල පාර්ශව විසින් නිදහස් කිරීමට ඉල්ලීම් කරනු නොලැබූ ඉඩම් ඉල්ලීම් පිළිබඳ තැන්පතු ද ඇතුලත්ව වසර දෙකකට වැඩි සියළුම අනෙකුත් තැන්පතු මුදල් රෙගුලාසි 571(3) ට අනුව රජයේ ආදායමට බැර කළ යුතු වුවත්, රුපියල් 8,873,255 ක් වූ වසර දෙකක් ඉක්මවා ඇති තැන්පත් රජයේ ආදායමට බැර කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලැසුම් කිරීම

(අ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ගිණුම් චක්‍රලේඛ අංක 02/2018 හා 2018 ජනවාරි 29 දිනැති චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනයා වෙත සපයන සේවා ප්‍රමුඛතා ගත කොට ප්‍රධාන සේවාවන් 5 කට අදාළව ප්‍රශස්ත ඉලක්කයන් තීරණය කර එම ඉලක්ක පිළිබඳ වාර්තාවක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එම චක්‍රලේඛයේ 2.5 හා 2.6 ඡේදයන්ට අනුව සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ප්‍රශස්ත ඉලක්කයන් සාරාංශගත කොට සකස් කරන ලද වාර්තාවක් විගණකාධිපතිටද පිටපත් සහිතව ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සෑම වර්ෂයකම ජනවාරි 15 වන දිනට පෙර ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 2022 වර්ෂයට අදාළව එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ අංක PTF/01/BP – 2022/01 හා 2021 සැප්තැම්බර් 07 දිනැති ලිපියේ ඇමුණුම් අංක 02 අනුව පෙර පාසල් සංවර්ධනය, සමාජ සුභසාධනය හා සමාජ සංවර්ධනය ක්ෂේත්‍රය යටතේ හඳුනාගත යුතු වුවත්, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන රුපියල් මිලියන 03 වැඩසටහනේදී සේරුවිල ග්‍රාම නිලධාරී වසම සඳහා නෙළුම් පෙර පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම නම් වූ ව්‍යාපෘතිය පොදු යටිතල පහසුකම් සංවර්ධනය යටතේ හඳුනාගෙන නිබීමෙන් සියයට 30 ක් ලෙස රුපියල් 900,000 ක් ඇස්තමේන්තු ප්‍රතිපාදන වැඩියෙන් වෙන් කර තිබුණි.

(ඇ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/NPD/02/2021 හා 2021 දෙසැම්බර් 15 දිනැති චක්‍රලේඛයේ 3.1 වගන්තියට පටහැනිව ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන සහිතව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යවන ලද සංවර්ධන යෝජනා හා අනුමැතිය ලබාදී තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම් ගතවී තිබූ දිනයට පසුව බව නිරීක්ෂණය විය.

(ඈ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/NPD/02/2021 හා 2021 දෙසැම්බර් 15 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම I හි 2.4 වගන්තිය අනුව ඉල්ලුම්කරුවන් අතරින් හැකි සෑම විටම තරුණයන්, කාන්තාවන් හා විශේෂ හැකියා ඇති පුද්ගලයින් වෙත විශේෂ අවධානයක් ලබා දිය හැකි බව දක්වා තිබුණද, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ගම සමග පිළිසඳරක් වැඩසටහනේ ජීවනෝපාය සංවර්ධන ක්ෂේත්‍රය සඳහා වයස අවුරුදු 60 ඉක්මවූ ප්‍රතිලාභීන් 78 ක් තෝරාගෙන ඔවුන් සඳහා රුපියල් 5,938,500 ක ප්‍රතිලාභ ලබා දී තිබුණි.

3.1.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකායේ අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ අංක PTF/01/1BP/2022/RDP හා 2021 දෙසැම්බර් 09 දිනැති ලිඛිතයේ 2 වගන්තිය අනුව කෘෂිකාර්මික, පශු, සීවර හා වැවිලි යනාදී ක්ෂේත්‍රවල ව්‍යාපෘති යෙදවුම් (පැළ වර්ග, පැටවුන් ආදී) සඳහා ඉහළ ඉල්ලුමක් ලබන වසර තුළ ඇති වන බැවින් ඒවා සැපයීමේ හැකියාව අදාළ ආයතනවලින්/ අමාත්‍යාංශවලින් විමසා තහවුරු කරගෙන ව්‍යාපෘති සංඛ්‍යාව හා ව්‍යාපෘතියේ ධාරිතාවය තීරණය කළ යුතු වුවද, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කර තිබූ රුපියල් මිලියන 3 වැඩසටහනෙහි සත්ත්ව පාලනයට අදාලව ප්‍රතිලාභීන් 75 ක් සඳහා එකතු වටිනාකම රුපියල් 7,110,000 ක් වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක ගම සමඟ පිළිසඳරක් වැඩසටහනෙහි සෝමපුර ප්‍රාථමික විද්‍යාලයේ වහල ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් 2022 ඔක්තෝබර් 06 දින සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම වහලයේ මුදුන් වහලයට යොදා තිබූ ඇස්බැස්ටෝස් අඩි 6 ක ප්‍රමාණයක් තැන් 2 කින් ගැලවී ගොස් තිබූ බැවින් ඒ සඳහා තාවකාලිකව මුදුන් උළු යොදා තිබුණි. වහළ ප්‍රතිසංස්කරණය කර මාසයක් ගතවීමට පෙර එහි වහළ ගැලවී ගොස් තිබුණද විගණන දින වන විට එම ගොඩනැගිල්ල වැඩ අවසන් කර භාර දී මාස 7 ක් පමණ ගතවී තිබූ නමුත් එම අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 75 ක් පමණ

ඉගෙනුම ලබන ප්‍රාථමික ගොඩනැගිල්ල වැසි කාලයේදී තෙමීමට ලක් වීම හා මුදුන් උළු පන්ති කාමර තුලට වැටිය හැකි වීම වැනි අනාරක්ෂිත තත්ත්වයක පැවතුණි.

(ආ) යුද්ධයෙන් අවතැන් වූ මහජනතාවට ස්ථිර නිවාස සකස් කර දීමේ වැඩසටහන යටතේ වෘත්තීය පුහුණු හා නිපුනතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක PH/NECA/2019-1 දරන හා 2019 ජනවාරි 12 දිනැති ලිපියේ 4.4 වගන්තිය අනුව නිවාස 05 ක් ඉදිකිරීම සඳහා ප්‍රතිලාභීන් පස්දෙනකුගේ බැංකු ගිණුමට රුපියල් මිලියන 4.98 බැගින් මුදල් නිදහස් කර තිබුණි. නිවාස ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබාදී වසර 3 කට වඩා වැඩියෙන් ගතවී තිබුණද ප්‍රතිලාභීන්ගේ නිවාස සම්පූර්ණයෙන්ම ඉදිකර නොනිබීම හේතුවෙන් මෙම නිවාස පදිංචි වීමට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති මුනෙච්චේනයි ග්‍රාම නිලධාරී වසමේ කුතුස් අදිපර් මාර්ගය හා එහි කාණු පද්ධතිය සකස් කිරීම සඳහා මිලියන 3 හා මිලියන 4 ව්‍යාපෘති යෝජනා යටතේ මුළු ප්‍රතිපාදනය වශයෙන් රුපියල් මිලියන 1.6 ක් වෙන්කර තිබූ අතර 2022 මාර්තු 30 දින ගිවිසුම්කරුවන් වෙත රුපියල් 1,386,000 ක් ගෙවීම් කර ව්‍යාපෘතිය නිම කර තිබුණි. නමුත් විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී මෙම කාණු පද්ධතිය තුල ජලය එක් රැස් වී ඇති අතර කාණුවලට පිටුපසින් වැලි නොදැමීම නිසා වලවල් සෑදී අවධිමත්ව නිමකර ඇති බවක් දක්නට ලැබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) සේරුවිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2022 වසරේ සිදු කල ප්‍රසම්පාදන අවස්ථා 8 කදී සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කල මිල, වලංගු කාලය ඉක්මවා මිලදී ගැනීම් සිදු කිරීම හේතුවෙන් එකතුව රුපියල් 799,870 ක් අදාල සැපයුම්කරුවන් වෙත පළමු එකඟතාවයේ සඳහන් මිල ගණන් වලට වඩා වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ජීවමිතික මුහුණු හඳුනා ගැනීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම 2022 මාර්තු 9 පැවැති ප්‍රසම්පාදන කමිටු රැස්වීම අනුව 2022 මාර්තු 08 දින පැවති තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය මත ආසිරි කම්පියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, කන්තලේ යන ආයතනය මගින් රුපියල් 41,500 ක මුදලකට මිලදී ගැනීමට තීරණය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටු තීරණය අනුව ගුණාත්මක බව පිළිබඳ සැලකිලිමත්ව ආසිරි කම්පියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් මිලදී ගැනීමට ගත් තීරණය ප්‍රසම්පාදනය ප්‍රමාද වීම හේතුවෙන් ඊළඟ අවම මිල ඉදිරිපත් කල වී කම්පියුටර්ස් ඇන්ඩ් ඇසෙසරීස් ආයතනයෙන් ගැනීමට කටයුතු කලද එම යන්ත්‍රය දෝෂ සහගතව



පැවති හෙයින් නැවත සාමාන්‍ය ඇඟිලි සලකුණු යන්ත්‍රයකට මාරු වීමට සිදුවී තිබුණි. මෙහිදී නිවැරදි තීරණ නිවැරදි අවස්ථාවේදීම ක්‍රියාත්මක කලේ නම් මෙම දුර්වලතාවයන් මඟ හරවා ගනිමින් ගුණාත්මක ජීවමිතික මුහුණු හඳුනා ගැනීමේ යන්ත්‍රයක් මිලදී ගත හැකිව තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.1 වගන්තිය අනුව ඵලදායි තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට, ඒ අනුව ලැබුණු සියළුම ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය හා තරඟකාරී බවක් නොමැති බව ලද ලංසු සංඛ්‍යාව මත පමණක් තීරණය නොකළ යුතු බව දක්වා තිබුණි. 2022 වර්ෂයේදී කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන සිදු කිරීමේදී ආයතන එකකින් පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබියදී එම මිල ගණන් ඉදිරිපත් කල ආයතනය මඟින්ම මිලදී ගැනීම් සිදු කර තිබූ අවස්ථා 10 ක් පැවති අතර එහි එකතු වටිනාකම රුපියල් 1,098,968 ක් විය. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2(අ) වගන්තිය අනුව පුළුල් ප්‍රචාරයක් ලබා දීමෙන් පසුව ලංසු එකක් පමණක් ලැබුණද වෙළඳපල වටිනාකම් අනුව සැසඳීමේදී සඳහන් කර ඇති ලංසු මිල සාධාරණ නම්, ලංසු කැඳවීමේ ක්‍රියාවලිය වලංගු බවට සලකනු ලැබිය හැකි බවට දක්වා තිබුණද එසේ වෙළඳපල වටිනාකම් අනුව සැසඳීම් කර ලංසුකරු තීරණය කර තිබූ බවට තොරතුරු අදාල ලිපි ගොනු වල දක්නට නොලැබුණි.

(ඈ) භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන තීරණය ගත් අවස්ථාවේදීම ක්ෂණිකව මිලදී ගැනීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කල යුතු වුවත් කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාණ්ඩ මිලදි ගැනීම් සිදු කිරීමේදී දින 14 සිට දින 50 ක ප්‍රමාද කාලයක් පැවතීම හේතුවෙන් මිල වැඩිවීම නිසා මිල ගණන් කැඳවීමේදී ඉදිරිපත් කල මිලට සැපයීමට සැපයුම්කරුවන් එකඟ වී නොතිබුණු අවස්ථා පැවතුණි.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 ඡේදය සහ 2012 අගෝස්තු 08 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිපූරක අංක 27 හි 2.8 ට අනුව විශේෂ තත්ත්වයේ යන්ත්‍ර මිළදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී එම යන්ත්‍ර පිළිබඳව විශේෂ දැනුම සහිත පුද්ගලයින්ගෙන් සමන්විත තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් මෙම යන්ත්‍රවල විස්තර පත්‍රිකාව හා අවශ්‍යතාවය තාක්ෂණික ඇගයීම් සිදුකර තවද මිළදී ගැනීමෙන් අනතුරුව එය සහතික කළ යුතුව තිබුණි. නමුත් සුදුසු ක්ෂේත්‍රයේ ශිල්පීය දැනුම ඇති නිළධාරීන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ පත් නොකිරීම හේතුවෙන් තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2021 වර්ෂයේ සෞභාග්‍යා වැඩසටහන යටතේ රටකජු නිෂ්පාදනය කරන යන්ත්‍ර දෙකක් මිළදී ගැනීම මඟින් මිළදී ගැනීමේ අරමුණ ඉටුනොවීම හේතුවෙන් මෙම යන්ත්‍ර දෙකම සැපයුම්කරුවන් වෙත ලබා දී ඒ වෙනුවට වසරකින් පසු රුපියල් 823,000 ක් වටිනා යන්ත්‍රයක් 2022 පෙබරවාරි 03 දින ලබාගෙන තිබුණි. එම හේතුවෙන් ප්‍රතිලාභීන්ට ලැබිය යුතු ප්‍රතිලාභය වසරකින් ප්‍රමාද වී තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 753 (1) අනුව නිකුත් කිරීමේ ඇණවුම් පොත අනුව නිකුත් කල භාණ්ඩ වෙනුවෙන් ලැබෙන ලැබීම් ඇණවුම් ගොනු කර තැබිය යුතු වුවත්, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් යවන ලද අයිතම 7 කට අදාල භාණ්ඩ වර්ග 13 ක් ආයතන 2 ක් වෙත ලබාදී තිබුණද ඒ වෙනුවෙන් ලැබීම් නියෝග ලැබී නොතිබුණි.

(ආ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 10 දිනැති අංක 03/2018 දරන රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය - රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම මැයෙන් වූ චක්‍රලේඛය අනුව වාහනවල ලියාපදිංචි අයිතිය තමා සතු නොවන වාහන සම්බන්ධයෙන් ලියාපදිංචි අයිතිය නිරවුල් කරගත යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් තමා සතු වාහන 56 ක ලියාපදිංචි අයිතිය එසේ නිරවුල් කර නොගත් අවස්ථා පැවතිණි.

(ඇ) මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ 2018 ඔක්තෝම්බර් 10 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 03 වන වගන්තියට අනුව ගර්හිත වාහන හෝ අබලි වාහන ලෙස අපහරණය කිරීමට නියමිත වාහන වල නිත්‍යානුකූල අයිතිය පිළිබඳව ගැටළු පවතින අවස්ථාවලදී එවැනි වාහන අපහරණය කිරීමට පෙර එහි දැක්වූ ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාළ ආයතනය විසින් ලියාපදිංචි අයිතිය ලබා ගත යුතු අතර ඒ සමගම එම වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමේ ක්‍රියාවලියද සිදුකළ යුතු බවට දක්වා තිබුණද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෙම කාර්යය සිදු කර නොතිබීමෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අපහරණය කළ යුතු ලෙස හඳුනාගත් මෝටර් සයිකල් 21 ක්ද මූතූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අපහරණය කළ යුතු ලෙස හඳුනාගත් මෝටර් සයිකල් 06 ක්ද වාහන අපහරණ කටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිපූරක 38 හි 9.3.1 (ආ) වගන්තිය අනුව අළුත්වැඩියා වියදම රුපියල් 500,000 ඉක්මවන්නේ නම් අමාත්‍යාංශ ලේකම්ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබුනද සේරුවිල, වෙරුගල් හා තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් එකතු වටිනාකම රුපියල් 1,767,427 ක් වූ වාහන 3 ක අළුත්වැඩියා සම්බන්ධයෙන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට පෙර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.4 පාඩු හා හානි

මුදල් රෙගුලාසි 110(2) අනුව ගණන්දීමේ නිලධාරියා විසින් සෑම මුදල් වර්ෂයකදීම වැය ශීර්ෂයක එක් එක් වැඩසටහන සම්බන්ධව සිදු වූ හානි පිළිබඳ ප්‍රකාශයක් වෙන වෙනම පිළියෙල කල යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල මූල්‍ය ප්‍රකාශනවල කටයුතු අවසන් නොවූ එකතු වටිනාකම රුපියල් 4,910,566 ක් වූ වාහන අනතුරු සම්බන්ධයෙන් ඇතිවූ අලාභ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ සිටින දරිද්‍රතාවයෙන් පෙලෙන ජනගහනය 31,698 ක් වුවද සමෘද්ධි සහනාධාර වාර්තාව අනුව සමෘද්ධි ලබාගත් සමෘද්ධි ලාභීන් සංඛ්‍යාව 59,023 ක් වීම විගණනයේදී ගැටළු සහගත විය. තවද සමෘද්ධි ප්‍රතිලාභ වලට හිමිකම් නොලබන පුද්ගලයින් 27,325 ක් වෙනුවෙන් රුපියල් මිලියන 1,049.7 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) පාලෙතෝපූර්, මූතූර් බටහිර, තඹලගමුව, කන්තලේ නගරය සහ භාතියගම සමෘද්ධි බැංකුවල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ශේෂ පිරික්සුම ප්‍රකාරව කල් ඉකුත් වූ ණය එකතුව රුපියල් මිලියන 214.79 ක් හිඟහිටව පැවතුණි.

(ඇ) කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සමෘද්ධි බැංකු 3 ක පවතින අවිනිශ්චිත ගිණුම්වල එකතුව රුපියල් මිලියන 177.61 ක හර ශේෂයක් පැවතුණි. මෙම ශේෂය ඇති වීමට බලපෑ වූ කරුණු හඳුනා ගෙන ඒවා ගැලපීම් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) තඹලගමුව, භාතියගම හා කන්තලේ නගරය යන සමෘද්ධි බැංකු වල සමෘද්ධි ඉතිරිකිරීම් සහිත ප්‍රතිලාභීන් 254 කට අයත් රුපියල් 30,000 ක් ඉක්මවූ එකතුව රුපියල් මිලියන 14.33 ක මුදල් සමෘද්ධි බැංකුවේ ඉතිරි කිරීම් ලෙස ඉතා දීර්ඝ කාලයක සිට තිබියදීත් එය නොසළකා හැර ඔවුන් වෙත මාසික සමෘද්ධි සහනාධාර ලබා දී තිබුණි.

(ඉ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක DSD/Ho/05/MF/01/චක්‍රලේඛ දරන සහ 2022 මැයි 26 දිනැති චක්‍රලේඛයේ 5.4 ඡේදය අනුව විශේෂ ආධාර මුදල් එක් එක් පුද්ගලයාගේ ඉතිරි කිරීමේ ගිණුම්වලට බැර කළ පසු, ලබාගත් අරමුදල් ගිණුමේ ශේෂයක් නොතිබිය යුතුය. තවද ශේෂයක් ඇත්නම් එම මුදල් ලබා දිය යුතු පුද්ගලයන් සොයා ඔවුන්ගේ ගිණුම්වලට බැර කල යුතු වුවත් කින්නියා හා කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඇති සමෘද්ධි බැංකු විසින් කාණ්ඩ අංක

4062 යටතේ ලෝක බැංකු ආධාර, ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ලබා දුන් සහනාධාර මුදල් එකතුව රුපියල් මිලියන 14.09 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවත්වාගෙන ගොස් තිබුණි.

(ඊ) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2022 මාර්තු 02 දිනැති අංක DSD/HO/SW/14/19/01/Circular දරන සමෘද්ධි සහනාධාර ක්‍රියාත්මක කිරීම පිළිබඳ චක්‍රලේඛය අනුව 2022 අප්‍රේල් මාසයේ සිට සමෘද්ධි ප්‍රතිලාභීන්ට ලබාදෙන ගෙවීම්වල සිදුවන වැඩිවීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම නැවත දැනුම් දෙනතුරු අත්හිටුවිය යුතු බවට සඳහන් කර තිබුණි. එසේ වුවද කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිටින ප්‍රතිලාභීන්ට සමෘද්ධි මාසික දීමනා අළුතින් ලබා දී තිබූ අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස එකතුව රුපියල් 661,000 ක් සමෘද්ධි මාසික දීමනා 2022 අප්‍රේල් මාසයෙන් පසුවත් ප්‍රතිලාභීන් 25 කට ලබාදෙමින් පැවතුණි.

(උ) කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්ථිර නිවාස ඉදිකිරීමේ වැඩසටහන යටතේ 2019 වර්ෂයේ ප්‍රතිලාභීන් 5 දෙනෙකුට ලබාදුන් මුළු ප්‍රතිපාදන මුදල වූ රුපියල් 4,975,000 න් රුපියල් 505,000 ක් අදාල ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා නොකොට ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම් වල වසර 3 ක කාලයක් රඳවා තිබුණි.

(ඌ) මොරවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු නිල නිවාස 3 ක් විධිමත් ආකාරයෙන් නිල නිවාස වල පදිංචිකරුවන් වෙත පවරා දී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වාර්තා හා ලිපි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි.

4 තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

තිරසාර ඉලක්කයන් පිළිබඳ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි දැනුවත් වී නොතිබුණු අතර තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම පිළිබඳ ඇගයීමක් කිරීමට නොහැකි විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජේෂ්ඨ මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 13 ක්ද තෘතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 29 ක්ද ද්විතික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 47 ක් හා ප්‍රාථමික මට්ටමට අයත් නිළධාරි තනතුරු පුරප්පාඩු 43 ක්ද වශයෙන් මුළු

පුරප්පාඩු ප්‍රමාණය 132 ක් විය. එහිදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක ද්විතියික මට්ටමට අයත් නිළධාරීන් 70 දෙනෙකුගේ පුරප්පාඩු පැවති නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 ක ද්විතියික මට්ටමේ නිළධාරීන් 25 දෙනෙකු අතිරික්තව පැවතුණි. මෙම පුරප්පාඩු සමතුලනය කල යුතුව පවති.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවා කාලය වර්ෂ 05 ක් ඉක්මවා සිටින නිලධාරීන් සම්බන්ධයෙන් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර නොතිබීම නිසා නගරයෙන් දුර බැහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දීර්ඝ කාලයක සිට ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අසාධාරණයක් සිදු වී තිබුණි.

එම්.පි.අයි.එම්.රෂ්මි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය
2022 වසරේ වාර්ෂික සැලැස්මතුල අන්තර්ගත ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

අංකය	විශේෂ දර්ශක (හඳුනාගත් ප්‍රමුඛ මහජන සේවාවන්)	අපේක්ෂිත වාර්ෂික ඉල්කක	සමුච්චිත ප්‍රගතිය	තත්‍ය ප්‍රතිඵල අපේක්ෂිත ප්‍රතිපලවල ප්‍රතිශතයක් ලෙස		
				100% - 90%	**75%- 89%**	**50% - 7$%**
1	උපත්, විවාහ, මරණ සහතික ලියාපදිංචිය	85,000	50,600	-	-	59.52%
2	ජාති හැඳුනුම්පත් සඳහා අයදුම්පත් සකස් කිරීම	35,000	17,250	-	-	49.28%
3	ඉඩම්බලපත්‍ර හා ඔප්පු සකස් කිරීම	400	24	-	-	6%
4	ආදායම් බලපත්‍ර අලුත් කිරීම හා නිකුත් කිරීම	75,000	30,700	-	-	40.93%
5	ගැබිණි මව්රුන් සඳහා පෝෂණ කූපන් නිකුත් කිරීම	75,000	63,430	-	84.57%	-
	සමස්ථ කාර්යසාධනය	**270,400**	**69,440**	-	-	**60.05%**

5. තිරසර සංවර්ධන අරුමුණු (එස්ඩීජී) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාල තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

අංකය	ප්‍රධාන විෂය ක්ෂේත්‍රය	මූලික ක්‍රියාකාරම්	තිරසාර සංවර්ධන අභිමතාර්ථ/අරමුණ			ප්‍රතිදානය (මූලික කාර්ය සාධන දර්ශකය)		සාධන ලබාගැනීමේ ප්‍රගතිය		
						ඉලක්ක අංකය	සාධනය	ඉලක්ක අංකය	සාධනය	ඉලක්ක අංකය
01	ජීවනෝපාය සංවර්ධන කටයුතු	එළුවන් සහ පැටවුන් සැපයීම, ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ ද්‍රව්‍ය සැපයීම	සෑම තැනකම සෑම ආකාරයකින්ම දුප්පත්කම අවසන් කරන්න	1.1.1 1.2.1 1.4.1 1.5.2 1.a.1		3,256	අදාළ ප්‍රදේශයේ දරිද්‍රතාවය 25% කින් පහත වැටී ඇත.	√		
02	දරුවන්ගේ පෝෂණය සහතික කරන්න	උදැසන ආහාර සැපයීම කෘෂිකර්ම සහ ධීවර උපකරණ සැපයීම	කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩි දියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	2.1.1 2.2.1 2.41	2.2.2	14,145 9,952	පෝෂණ මට්ටම 35% වැඩි වීම සාක්ෂරතා අනුපාතය 25% කින් වැඩි විය	√		
03	පුරවැසියාගේ සෞඛ්‍ය පහසුකම් සහතික කිරීම	සෞඛ්‍ය සංවර්ධනය සඳහා ද්‍රව්‍ය සැපයීම පිටි, ළමා උද්‍යානය ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ සියලු වයස්වල සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	3.1.1 3.2.1		9,374 5,800	ළදරු මරණ අනුපාතය 10% කින් අඩු වී ඇත නොමේරූ ළදරු උපත් අනුපාතය ද අඩු වී ඇත.	√		
04	යටිතල පහසුකම් සංවර්ධන පහසුකම් සහතික කිරීම	පාසල්, පෙර පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනය සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම	4.1.1 4.a.1		39,578	අපේ දිස්ත්‍රික්කයේ සාක්ෂරතා අනුපාතය 30%කින් වැඩි වෙලා	√		
05	සැමට ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම	බිල්පත් පියවීමේ කාර්යය ජල සැපයුම් සම්බන්ධතා ලබා දීම වැසිකිළි ඉදිකිරීම සනීපාරක්ෂක පහසුකම් සැපයීම	සියල්ලන්ටම ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි බව සහ තිරසාර කළමනාකරණය සහතික කිරීම	6.1.1 6.2.1 6.3.1 6.4.1	6.4.2	7,325	ගුණාත්මක පානීය ජල භිභය 25% කින් අඩු කර ඇත.	√		

අංකය	ප්‍රධාන විෂය ක්ෂේත්‍රය	මූලික ක්‍රියාකාරම්	නිරසාර සංවර්ධන අභිමතාර්ථ/අරමුණ			ප්‍රතිදානය (මූලික කාර්ය සාධන දර්ශකය)		සාධන ලබාගැනීමේ ප්‍රගතිය		
						ඉලක්ක අංකය	සාධනය	ඉලක්ක අංකය	සාධනය	ඉලක්ක අංකය
06	සියල්ලන්ටම බලශක්තිය සැපයීම සහතික කරන්න	විදුලි සම්බන්ධතා ලබා දීම	සැමට දැරිය හැකි, විශ්වසනීය, තිරසාර සහ නවීන බලශක්ති සඳහා ප්‍රවේශය සහතික කිරීම	7.1.1	7.1.2	987	විදුලි අවශ්‍යතාවය 1%ක් බව සොයාගෙන ඇත.			√
07	පුද්ගල ආදායම සහතික කරන්න	සංචාරක ව්‍යාපාරය සඳහා අලෙවිකරණ පහසුකම් වැඩිදියුණු කිරීම	තිරසාර, ඇතුළත් සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායී රැකියා සහ සියලු දෙනාටම යහපත් රැකියාවක් ප්‍රවර්ධනය කිරීම	8.1.1		258	ඒක පුද්ගල ආදායම වැඩිවෙලා විරැකියා අනුපාතය සියයට 10කින් අඩුවෙලා	√		
		ස්වයං රැකියා සඳහා ද්‍රව්‍ය සැපයීම		8.91		3,194				
08	නිසි ප්‍රවාහන සහ ප්‍රවේශ පහසුකම් සහතික කරන්න	මාර්ග සහ බෝක්කු ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම	ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීම, ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීම	9.1.1	9.1.2	57,447	මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ප්‍රවාහන මාර්ගවලින් 35%ක් සම්පූර්ණ කර ඇත		√	
09	මිනිස් ජනාවාස සහතික කරන්න	නගර අලංකරණය	නගර ඇතුළත්, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර කරන්න	11.6.1		55,145	විධිමත් ජනාවාස 20% කින් වැඩි වීම	√		
		නිවාස ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම		11.1.1		859				
10	වනජීවී සහ මිනිසුන් අතර ගැටුම් අවම කිරීමට වග බලා ගන්න	ගම්මානයේ පැළ වනාන්තරය පිහිටුවීම	භෞමික පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, වනාන්තර කළමනාකරණය කිරීම, කාන්තාරකරණයට එරෙහිව සටන් කිරීම සහ ප්‍රතිලෝම කිරීම සහ ජෛව විවිධත්ව හානිය නැවැත්වීම	15.1.1		750	ප්‍රදේශයේ වනාන්තර ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර වනජීවී ආරක්ෂාව ද තහවුරු කර ඇති අතර ප්‍රදේශයේ අලි මිනිස් ආරවුල් සියයට 50ක් තුරන් කර ඇත.		√	
		අලි වැට ඉදිකිරීම		15.a.1		4,750				
මුළු						212,820 කි				

5.2. තිරසර සංවර්ධ ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහන හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කය වූ කලි කිලීන ස්භාවික විපත් හා දිගුකාලයක් පැවැති යුද්ධය නිසා පසුගාවීම තත්තවට පත් වූ දිස්ත්‍රික්කයකි. සිවිල් පරිපාලනය හා සාමාන්‍ය ජන ජීවිතය යලි ස්ථාපිත කිරීමත් සමඟ, ඉතා සීග්‍රයෙන් දියුණුවන දිස්ත්‍රික්කයක් බවට එය පති වී ඇත.

තිරසාර සංවර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීම සමස්ථයක් ලෙස මෙම දිස්ත්‍රික්කයට අභියෝගයක් වන නමුත්, දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ අවශ්‍යතා හා තිරසාර සංවර්ධන අරමුණු 17 හි ඇතුලත් කරුණුද සැලැකිල්ලට ගනිමින් දිස්ත්‍රික් කාර්යාලයේ සංයුක්ත සැලැස්ම සකස් කර ඇත.

ඉහත අනු ශිර්ෂ 4.1 හි විස්තර කර ඇති පරිදි සැලැසුම් කර තිබූ ඉලක්කයන්ගෙන් බොහොමයක් අපේක්ෂිත මට්ටමට ළඟාකර ගැනීමට හැකි වී ඇත. එමෙන්ම දිස්ත්‍රික් ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා තව බොහෝ දුර යාමට ඇත.

සාමාන්‍ය ජන ජීවිතයේ ඇති වන ධූවිවාවවන තත්ත්වයන්, ආර්ථිකයේ ඇති වන උච්වාවවනයන් මෙන්ම ත්‍රස්ථවාදි කටයුතු හා ස්භාවික විපත් නිසා නීතිය හා සාමය පවත්වාගෙන යාමට ඇති වන බාධාවන් නිසා සැලැසුම් කළ කාර්යයන් එහි උපරිමයෙන් ස්ථාපනය කිරීමට අපහසු මෙන්ම එහි ප්‍රතිඵල සැලසුම් කළ ආකාරයටම ළබා ගැනීම අභියෝගයක් ව පවතී.

06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	52	39	13
තෘතීයික	48	18	30
ද්විතීයික	1,014	861	153
ප්‍රාථමික	144	105	39
	1,258	**1,023**	**235**

6.2. ආයතනයේ කාර්ය සාධන උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

ත්‍රීකුණාමලය දිස්ත්‍රික්කයේ සමස්ථයක් ලෙස කාර්ය මණ්ඩයෙන් අනුමත මට්ටමට වඩා 235 ක ඌණතාවක් පවති. කාර්ය මණ්ඩලයේ හිගයක් පැවැතීම පෙර වසර වල දිගින් දිගටම පැවැති ගැටළුවක් වන නමුත් මෑතකාලී දෙවසර වන විට එම හිගය අඩුකැගැනීමට හැකි වී ඇත.

දිස්ත්‍රික්කයේ සිවිල් ජනයා වෙත සිය සේවාන් ඉටු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආශ්‍රිකව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තෘතීක මට්ටමේ නිලධාරී ඌණතාවය දැඩිව බලපා ඇත. දැනට සිටින තත්‍ය කාර්ය මණ්ඩලයට සමානුපාතිකව ජ්‍යෙෂ්ඨ හා තෘතීක මිට්ටමේ නිලධාරීන්ගේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 58 ක් හා 42 ක මට්ටමක පවතී. මෙම තත්ත්වය දෛනික පරිපාලන තත්තවයට දැඩිව බලපානු ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (රු)		වැඩසටහනේ ස්භාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
ප්‍රාදේශීය හා ග්‍රාමීය සංවර්ධනය	31	එක් දින	19,663.00		දේශීය	ග්‍රාමීය සංවර්ධනය
කාර්යාල පරිපාටි හා කාර්යාල ක්‍රම - (T)	26	එක් දින	13,394.00		දේශීය	කාර්යාල ක්‍රම
කාර්යාල පරිපාටි හා කාර්යාල ක්‍රම - (S)	19	එක් දින	10,930.00		දේශීය	කාර්යාල ක්‍රම
කා.කා.ස සඳහා ප්‍රායෝගික පුහුණු (T)	16	එක් දින	9,340.00		දේශීය	කාර්යාල ක්‍රම
කා.කා.ස සඳහා ප්‍රායෝගික පුහුණු (S)	21	එක් දින	13,242.75		දේශීය	කාර්යාල ක්‍රම
රාජ්‍ය සේවා රියදුරන්ගේ වගකීම	11	එක් දින	8,485.00		දේශීය	වාහන නඩත්තුව
කාර්යක්ෂමතා කඩයිම් 1 පංතිය රජ්‍ය කළ. ස. (T)	13	දස දින	100,081.63		දේශීය	මූ.රෙ. හා ආ. සංග්‍රහය
ආයතනික ඵලදායිතාව	30	එක් දින	21,263.70		දේශීය	ඵලදායිතාව
මූලික ඉදිකිරීම් ශිල්පක්‍රම (3)	180	එක් දින	95,813.69		දේශීය	මූලික ඉදිකිරීම් ශිල්පක්‍රම
රාජ්‍ය වත්කම් කළමනාකරණය	32	එක් දින	19,717.00		දේශීය	රාජ්‍ය වත්කම් කළමනාකරණය
ව්‍යාපෘති කළමනාකරණය	33	එක් දින	21,160.40		දේශීය	ව්‍යාපෘති කළමනාකරණය
කාර්යක්ෂමතා කඩයිම් 1 පංතිය රජ්‍ය කළ. ස. (S)	6	දස දින	67,232.96		දේශීය	මූ.රෙ. හා ආ. සංග්‍රහය
ප්‍රසම්පාදන කාර්යය පරිපාටිය	31	දෙදින	30,769.28		දේශීය	ප්‍රසම්පාදනය
මහජන සම්බන්ධතා	34	එක් දින	21,144.60		දේශීය	මහජන සම්බන්ධතා
සංනිවේදන කුසලතා	27	එක් දින	19,804.60		දේශීය	සංනිවේදන කුසලතා
අල්ලස් හා දූෂණ	19	එක් දින	19,044.00		දේශීය	අල්ලස් හා දූෂණ වැලැක්වීම
නායකත්ව හා ධාරිතා සංවර්ධන	80	දෙදින	110,600.00		දේශීය	නායකත්ව හා ධාරිතා සංවර්ධන
එකතුව			601,686.61			

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද කෙටියෙන් පැහැදිලි කරන්න

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපනය කර ඇති දිස්ත්‍රික් කුසලතා සංවර්ධන ඒකකය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යායේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාවල දැනට සිටින කාර්ය මණ්ඩලයේ හා අලුතින් එක්වන කාර්යය මණ්ඩලයේ දැනුම, කුසලතා, ආකල්ප සහ නිපුණතා වැඩිදියුණු කිරීම සිදු කරනු ලබයි. සේවකයන්ගේ දෛනික සේවා සැපයීම සඳහා අවශ්‍ය වන සීමිත සහ තෝරාගත් ක්ෂේත්‍රවල මූලික පුහුණු ලබාදීම සිදු කරනු ලබයි. මෙය දිස්ත්‍රික් ලේකම් කාර්යාලේ හා ප්‍රාදේශිය ලේකම් කාර්යාවල සේවකයන්ගේ සේවා ඵලදායි බව ඉහළ නැංවීම සඳහා බෙහෙවින් උපකාරී වී ඇත.

එමෙන්ම නැගෙනහිර පළාත් සභාවේ හා දාස්ත්‍රික්කයේ ඇති වෙනත් දෙපාර්තමේන්තු වල කාර්යය මණ්ඩලය ද මේ සඳහා

මේ වන විට බොහෙමයක් ම රාජ්‍ය සේවා ලබාදීමේ ක්‍රම වේද නව තාක්ෂණය සමඟ සමපාතව ඇති නිසා සෑම කාර්යය මණ්ඩලයේ අයකුම එම දැනුම ලබාගැනීම අනිවාර්යය කර ඇත. එමෙන්ම භාෂා කුසලතා ලබැගැනීම, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ වෙනත් රැකියාව සම්බන්ධ දැනුම පුහුණුව ලබා ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවක් කොට සලකනු ලැබේ. මෙමගින් අවසාන වශයෙන් අපේක්ෂා කරනුයේ රාජ්‍ය සේවාවේ ඵලදායි බව ඉහළ නැංවීමයි.

07. පරිච්ඡේදය අනුකූලතා වාර්තාව

අදාල කරගතයුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්වය (අනුකූලවේ/ අනුකූල නොවේ)	අනුකූල කොවීමට කෙටි පැහැදිළි කිරීම	අනනුකූලබව වලක්වා ගැනීමට ක්‍රියාමර්ග
1. පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම්			
1.1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලවේ		
1.2. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලවේ		
1.3. ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.4. ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5. විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6. වෙනත්	අදාල නොවේ		
02. පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)			
2.1.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන් කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.2. පුද්ගල පඩිනඩි ලේඛනය/පුද්ගල පඩිනඩි කාඩිපත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.3. විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.4. අභ්‍යන්තර විගණන වාර්තා ලේඛන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.5. සියළුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙළ කර නියමිත දිනට මහ භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
2.6. චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.7. ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.8. තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.9. හානි/පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.10. බැරකම් ලේඛනය යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
2.11. උප පත්‍රිකා පොත් ලේඛනය (ජීඒ - එන්20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
03. මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			

3.1. මූල්‍ය බලතල ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.2. මූල්‍ය බලතල පවරා දීම ආයතනය තුල පවරා දී තිබීම	අනුකූලවේ		
3.3. සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූලවේ		
3.4. 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රාජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත් ව කටයුතු කිරීම	අනුකූලවේ		
04. වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.2. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
4.3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
4.4. වාර්ෂක අයවැය ඇස්තමේන්තු සක්ස කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
5. විගණන විමසුම්			
5.1. විගණකාධිපතිවරයා විසින් නියමිත කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූලවේ		
06. අභ්‍යන්තර විගණනය			
6.1. මු.රෙ. 134 (2), DMA/1-2019, අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලවේ		
6.2. සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූලවේ		
6.3. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
6.4. මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
07. විගණන හා කළමනාකරණ කමිටු			
7.1. සීඑම්ඒ චක්‍රලේඛ 01- 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාල වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූලවේ		
08. වත්කම් කළමනාකරණය			
8.1. අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු	අනුකූලවේ		

කොමිස්ත්‍රෝලර් ජනරල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2. ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු නිලධාරියකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ත්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කිරීම	අනුකූලවේ		
8.3. රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාන්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපත්වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූලවේ		
8.5. ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රේ.772 අනුව සිදු කිරීම	අනුකූලවේ		
09. වාහන කළමනාකරණය			
9.1. සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
9.2. වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 අවහිරතා නිසා නොහැකි විය	2022 වසරේදී නිමකරනු ඇත
9.3. වාහනයේ ලොග් පොත් පවත්වා ගනිමින් යාවත්කාලීක කර තිබීම	අනුකූලවේ		
9.4. සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලවේ		
9.5. 2016-12-29 දිනැති අංක 2016-/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා	අනුකූලවේ		
9.6 කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාල නොවේ		
10. බැංකු ගිණුම් කළමනාකරණය			
10.1නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
10.2. සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල ඉදිරියට ගෙන අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලවේ		
10.3. බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
11. ප්‍රතිපාදන උපයෝජනය			
11.1 සලසා තිබුණු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලවේ		

11.2. මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලවේ		
12. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම			
12.1. සීමාවන් වලට අනුකූල වීම	අනුකූලවේ		
12.2. හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කිරීම	අනුකූලවේ		
12.3. වර්ෂයකට වැඩි කාලයක් සිට පැවත එන හිග හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූලවේ		
13. පොදු තැන්පත් ගිණුම			
13.1. කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලවේ		
13.2. පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
14. අග්‍රිම ගිණුම			
14.1. සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුය වෙත ප්‍රේෂණය කර තිබීම	අනුකූලවේ		
14.2. මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූලවේ		
14.3. මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලවේ		
14.4. අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලවේ		
15. ආදායම් ගිණුම			
15.1. අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලවේ		
15.2. රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැරකර තිබීම	අනුකූලවේ		
15.3. මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ගිබීම	අනුකූලවේ		
16. මානව සම්පත් කළමනාකරණය			
16.1. අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්යය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලවේ		
16.2. කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලවේ		
16.3. 20.09.2017 දිනැති එම්එස්ඩී චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
17. මහජනයා වෙත තොරතුරු ලබාදීම			

17.1. තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු ලබාදීමේ නිලධාරියකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලවේ		
17.2. ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා පබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසංසා/චෝදනා ප ල කිරීමට පමසුකම් සලසා තිබීම	අනුකූලවේ		
17.3. තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූලවේ		
18. පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1 අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූලවේ		
18.2. එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූලවේ		
19. මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1. 2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස්කොට තිබීම	අනුකූල නොවේ	සැලැස්ම යාවත්කාලීන කළ යුකුව ඇත	2022 වසරේදී නිම කෙරේ
19.2. කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සංවර්ධන සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	කොවිඩ් 19 සීමා නිසා සම්පූර්ණ කර නැත	
19.3. ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	2022 වසරේදී නිවැරිදිව සම්පූර්ණ කරනු ඇත	
19.4. ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර තිබීම	අනුකූල නොවේ	වගකීම පැවරූ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කරනු ඇත	
20. විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම			
20.1. ඉකුත් වාර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරිදි කොට තිබීම	අනුකූලවේ		